162 - 163 - sinhala 30-06-2004 10:03 Pagina 162

*Summaries in Sinhala*
*Intervention 2004, Volume 2, Number 2, Page 164 - 165*

# සාරාංශ සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත

## අප්‍රිකානු සරණාගත කඳවුරක මනෝ විශ්ලේෂණ රෝග

මෙම ලිපිය, කෙන්යාවේ කකුමා සරණාගත කඳවුරේ මානසික සෞඛ්‍ය සේවා ලබා ගැනීමට පැමිණි අය අතර මානසික රෝග තිබීම ගැන කළ අධ්‍යයනයක් විස්තර කරයි. මෙය පදනම් වී ඇත්තේ අවුරුදු තුනක් තිස්සේ, එහි හෙද-පරිපාලකවරයා විසින් තබා ගනු ලැබූ රෝගීන්ගේ ලොග් සටහන් පොත මතය. වැඩියෙන් ම කළ රෝග විනිශ්චය වූයේ පශ්චාත් ක්ෂතිමය පීඩන ව්‍යාධියයි (PTSD; පී.ටී.ඇස්.ඩී.). සොයා ගැනීම් වලින් දැක්වෙන්නේ කෙන්යාව වැනි අඩු ආදායම් ලබන රටවල ඇති සරණාගත කඳවුරු තුළ අඩු වියදමින් ප්‍රජා මානසික සෞඛ්‍ය ඒකකයක් ඇති කිරීම ප්‍රායෝගික දෙයක් බවයි. එවැනි සේවයකින් උදව් ලබා ගැනීමට ක්ෂණික සහ ක්‍රමයෙන් වැඩි වන ඉල්ලුමක් ඇති විය හැක.

**ප්‍රධාන වචන:** ක්ෂතිය, සරණාගතයෝ, ප්‍රජා මානසික සෞඛ්‍යය, සේවා ප්‍රයෝජනයට ගැනීම, පී.ටී.ඇස්.ඩී.

## නකිවේල් කඳවුරේ මානසික සෞඛ්‍ය ව්‍යාපාතිය: ක්ෂතියට පත් වූ සරණාගතයින්ට මනෝවිද්‍යාත්මක උදව්දීම සඳහා හැකියාවන් පලාත්බදව ගොඩනැගීම

නකිවේල් කඳවුරේ මානසික සෞඛ්‍ය ව්‍යාපාතියේ මූලික අරමුණ වන්නේ ව්‍යසන ප්‍රදේශයකදී ප්‍රාදේශීය ක්‍රියාකාරීන් විසින් ක්‍රියාත්මක කරන්නාවූ කෙටිකාලීන ප්‍රතිකාර විධික්‍රමවල ප්‍රයෝජනවත්භාවය තහවුරු කිරීමයි. මෙම ලිපිය ව්‍යාපාතිය සාකච්ඡා කරමින් ක්ෂතිමය සිද්ධීන්වලට ගොදුරුවුවන්ට උදව් කිරීමේ ක්‍රමයක් ලෙස ආඛ්‍යානීය හෙළිදරව් කිරීමේ සායනය (Narrative Exposure Therapy) සාකච්ඡාවට බඳුන් කරයි. සරණාගතවුවන් අතර පී.ටී.ඇස්.ඩී. රෝගය ව්‍යාප්තව පවතින මට්ටම සොයා ගැනීම සඳහා වසංගත රෝග අධ්‍යනයක්ද මෙම ව්‍යාපාතිය මගින් කරන ලදී. අනෙකුත් සමීක්ෂණ සමග එකග වෙමින්, ජනගහණ විද්‍යාත්මක සමීක්ෂණය හෙළිදරව් කළේ, උත්සන්න වූ පී.ටී.ඇස්.ඩී. රෝගය ඉතාමත් අධික ලෙස පවතින බව ය. මෙය රුවන්ඩා ජනයා අතර සියයට 31.1ක් ද සෝමාලියාවේ ජනගහණය අතර සියයට 47ක් ද විය. මේ තත්ත්වය පැවතියේ ක්ෂතිමය සිද්ධීන් සිදුවීමෙන් පසු සාමාන්‍යයෙන් අවුරුදු 9ක් හා 11ක් ඉක්ම ගොස් තිබිය දී ය. විශේෂිත සංස්කෘතික තත්ත්වයන්හි දී සාර්ථකත්වය අත්පත් කර ගැනීමට නම්, ක්‍රියාත්මක කල හැකි වූ ද විද්‍යාත්මක පර්යේෂණ මත පදනම් වූද, පශ්චාත් ක්‍ෂතිමය රෝග ලක්‍ෂණවලට ප්‍රතිකාර කිරීමේ මාර්ගෝපදේශකත්වයන් මානවදයාවාදී වැඩකටයුතුදී ප්‍රමුඛත්වයක් බවට පත් විය යුතු බව කතුවරු නිගමනය කරති.

**මූලික වචන:** මනෝ ක්ෂතිමය, පී.ටී.ඇස්.ඩී, සරණාගතයා, කඳවුර, උපදේශනය, සංවිධාන කළ ප්‍රචණ්ඩත්වය, සෝමාලියාව, රුවන්ඩාව.

162 - 163 - sinhala 30-06-2004 10:03 Pagina 163



## යුද්ධයෙන් නොනැසී බේරුණු අය සමග වැඩ කිරීම: සායනික මනෝ විද්‍යාඥයින්ගේ භූමිකාව

මේ ලිපියේ දී සායනික මනෝ විද්‍යාව සහ මනෝ චිකිත්සාව පිළිබඳ බටහිර පද්ධති ඒකාබද්ධ කිරීමට ඇති හැකියා ගවේශණය කෙරෙයි. ශ්‍රී ලාංකික සංස්කෘතිය උදාහරණයක් ලෙස සැලකෙන අතර, අගැයීම, මැදිහත්වීම, තක්සේරු කිරීම, උගැන්වීම සහ පර්යේෂණය සඳහා පුහුණු කිරීමේ විධිවිධාන සාකච්ඡා කරනු ලැබේ.

**ප්‍රධාන වචන:** සායනික මානසික විද්‍යාව, සාමුහිකත්වවාදී සංස්කෘතිය

## මානසික සෞඛ්‍ය කටයුතුවලදී භාෂා පරිවර්තකයින් සමග වැඩ කිරීමේදී නිවැරදි ක්‍රියාකාරීත්වය අරබයා මතුවන ගැටළු

නිසි මානසික සෞඛ්‍ය සේවාවන් ලබාගත හැකිවීම සඳහා, ප්‍රචලිත ව පාවිච්චි වෙන හෝ බහුතර ජනයා කථා කරන භාෂාවට සීමා නොවීමට නම් භාෂා පරිවර්තකයකුගේ හෝ ද්වි-සංස්කෘතික සේවකයෙකුගේ සේවය අවශ්‍ය ය. සන්නද්ධ ගැටුම් පවතින තත්ත්වයක හෝ සන්නද්ධ ගැටුම් පවතින ප්‍රදේශවලින් පැන ගොස් පිටරටවල පදිංචිය අපේක්‍ෂා කරන්නවුන්, සරණාගතයින් සහ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සමග හෝ භාෂා පරිවර්තකයින් ගේ ආධාරයෙන් වැඩ කරද්දී අනුගමනය කළ යුතු මනා භාවිතයන් සම්බන්ධයෙන් යෝජනා මෙම ලිපිය මගින් ඉදිරිපත් කැරෙයි.

**මූලික වචන:** භාෂා පරිවර්තකයින්, භාෂාව, සංස්කෘතිය, මානසික සෞඛ්‍යය/මානසික යහපැවැත්ම, පුහුණුව, සහාය.

---

## සන්නද්ධ ගැටුම් ක්ෂේත්‍රයේ උපදේශකයින් සඳහා සායනමය අධීක්‍ෂණය

මෙම ලිපියෙන් විස්තර කෙරෙන්නේ, මානසික සහාය, අධ්‍යාපනය සහ වෘත්තියමය ක්‍රියාකාරීත්වය මැනීම අන්තර්ගත කර ගන්නාවූ ව්‍යූහීය ක්‍රියාදාමයක් ලෙස උපදේශකයින්ගේ සායනමයත අධීක්‍ෂණයයි. මෙය පදනම් වී ඇත්තේ, සන්නද්ධ ගැටුම් වාතාවරණයන් තුල වැඩ කරන, සීමිත දැනුමක් ඇති උපදේශකයින්, අධීක්‍ෂණය කරද්දී කතුවරුන් ලබාගත් දැනුම මත ය.

**ප්‍රධාන වචන:** තක්සේරුව, ප්‍රශ්න-සංකල්පීකරණය, සායනමය අධීක්‍ෂණය, උපදේශනය.

## ඇෆ්ගනිස්ථානයේ ප්‍රජා මනොසමාජීය උපකාරය

2001 දී යුනිසෙෆ් ආයතනයේ ළමා රැකවරණය ආයතනය ඇෆ්ගනිස්ථානයේ නව ක්‍රියාමාර්ග දියත් කළේය. මෙහිදී අවධාරණය යෙදවූයේ මානසික සෞඛ්‍යය ලබාදීම ගැන නොව ප්‍රජාව මත පදනම් වූ මානසික සමාජීය සහයෝගය දීමේ මූලෝපායක් කෙරෙහි ය. මෙම සංවිධාන දෙක විසින් කරන ලද කාර්යයන්ට පදනම් වූ සිද්ධාන්ත මෙම ලිපිය මගින් සාකච්ඡා විය. 2001 සිට 2002 දක්වා කාබුල් නගරයේ දී කරනු ලැබූ මෙම පර්යේෂණ හා ව්‍යාපෘති සැලසුම් ද මෙම ලිපිය තුලින් ගවේෂණ කරනු ලැබේ.

**ප්‍රධාන වචන :** ප්‍රජාව මත පදනම් වූ මනෝසමාජ වැඩකටයුතු, ගුණාත්මක පර්යේෂණ, ළමයාගෙන් ළමයාට, කණ්ඩායම්.